# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX | YEAR OF OUR LORD JESUS CHRIST, 2025 MAY | Issue No. 06


## ශුද්ධවූ බයිබලය

**(යෙසායා 56:1-5)**

01. ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක: නුඹලා යුක්තිය පවත්වා ධර්මිෂ්ඨකම් කරන්න. මක්නිසාද මාගේ ගැළවීම පැමිණෙන්ටත් මාගේ ධර්මිෂ්ඨකම එළිදරව්වෙන්ටත් ළඟය.

02. මෙය කරන මනුෂ්‍යයාද මෙය අල්ලාගන සිටිමින්, සබත් දවස කඩනොකර එය පවත්වන්නාවූ, කිසි නපුරක් නොකරන ලෙස තමාගේ අත වලක්වාගන්නාවූ මනුෂ්‍ය පුත්‍රයාද වාසනාවන්තය.

03. ස්වාමීන්වහන්සේට එකතුවී සිටින විදේශියාද: ස්වාමීන්වහන්සේ තමන්ගේ සෙනඟ වෙතින් මා සැබවින් වෙන්කරනසේකැයි නොකියාවා. නපුංසකයාද: බලව, මම වියළි ගසක්යයි නොකියාවා.

04. මක්නිසාද මාගේ සබත් දවස් රක්ෂාකර, මා ප්‍රසන්න දේ තෝරාගෙන, මාගේ ගිවිසුම අල්ලාගෙන සිටින නපුංසකයන් ගැන ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක.

05. එනම් මාගේ ගෘහයෙහිද මාගේ භිත්ති ඇතුළෙහිද පුත්‍රයන්ටත් දූවරුන්ටත් වඩා සිහිවීම් ලකුණක්ද නාමයක්ද ඔවුන්ට දෙන්නෙමි; සිඳී නොයන සදාකාල නාමයක් ඔවුන්ට දෙන්නෙමි.සම්පූර්ණයෙන්ම ධර්මිෂ්ඨය.

## ඔබ අභියෝග වලට මුහුණ දීමට තරම් ශක්තිමත් නම්, ප්‍රවේසම් වෙන්න! !

*Sis. Angel*

## IF YOU ARE STRONG ENOUGH TO FACE CHALLENGES, BE CAREFUL!

*කැඳවීමේ ප්‍රතිරාවය සේවය පවුලේ සියලු සාමාජිකයින්ගේ සුභ පැතුම්!*



අපගේ පිය වූ දෙවියන් වහන්සේගේ ද ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ද කරුණාව හා සමාදානය ලැබේවා!

මෑතකදී මගේ විදේශ ගමන් බලපත්‍රය නැති වූ අතර මා එය සෑම තැනකම සෙව්වත් එය මට සොයා ගැනීමට නොහැකි විය. එනිසා මා මහත් අවුල් සහගත තත්ත්වයකට පත්විය. එය මා තැබුවේ කොතනද කියා මට ස්ථිරත්වයක් තිබුණද මා එය ගැනීමට ගිය විටදී එය එහි තිබුණේ නැත. මේ නිසා මගේ කනස්සලුභාවය වැඩි වූ අතර මා අස්සක් මුල්ලක් නෑරම එය සෙව්වෙමි. මා අවදිව සිටියත් නිදාගෙන සිටියත් මගේ විදේශ ගමන් බලපත්‍රය නැතිවීම නිසා වෙනත් කිසිවක් කෙරෙහි අවධානය යොමු කිරීමට මගේ සිතුවිලි ඉඩ නොදුන්නේය. ඉතා වැදගත් දෙය නම් මට එයා එය ඉතා ඉක්මනින් අවශ්‍ය විය. අලුත් විදේශ ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කිරීමට හෝ එය සෙවීම පිණිස කාල වේලාවක්ද නොතිබුණි.

මා වියරුවෙන් මෙන් මගේ නිවස සෝදිසි කරන විටදී ලූක් 15 වන පරිච්ඡේදය සඳහන් වී තිබෙන නැතිවූ බැටළුවා, නැති වූ කාසිය සහ

4 වෙනි පිටුවට ...




**Echo of His Call**

**Christian YouTube Channel!**

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.


Tamil Sunday Service – 8.30 A.M.

★ Please Subscribe and Share ★

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS

# from your dearly beloved brother...




"නුඹේ බර ස්වාමීන් පිට තබව, උන්වහන්සේ නුඹ උසුලන සේක. උන්වහන්සේ කිසි කලෙකත් ධර්මිෂ්ඨයා සෙලවෙන්ට නොදෙන සේක." (ගීතාවලිය 55:22)



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

අපගේ ස්වාමී වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මහිමවත් වූ නාමයෙන් ඔබට සුබ පතමි!

පසුගිය මාසයේ **කැඳවීමේ ප්‍රතිරාවය** තුළින් ඔබ ලැබූ ආශිර්වාද ගැන ඔබ දැක්වූ ප්‍රතිචාරයන් නිසා අප සතුටට පත් වූවෙමු. ඔබගේ යාච්ඤාව හා උපකාරය අපට මහත් ශක්තියකි. ස්වාමීන් වහන්සේ ඔබට මහත් ලෙස ආශිර්වාද කරන සේක. දෙවියන් වහන්සේගේ කරුණාව තුළින් පසුගිය මාසය පුරාම සාර්ථක ලෙස බොහෝ සේවාවන් කිරීමට අපට හැකි විය. **ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ** කඳවුර, තරුණ



*Youth Camp at St. Paul's Matriculation School Campus*

කඳවුර, එළිමහන් රැස්වීම්, ළමා සේවාවන්, දෙවියන් වහන්සේගේ සභාවේ සේවාවන් සහ පාසලේ වාර්ෂික උත්සවය, ශිෂ්‍යන්ගේ උපාධි පිරිනැමීම ආදී මේ සියල්ලම අප්‍රියල් මස 11 සිට 17 දක්වා දිනවලදී පැවැත්විය. මේ සෑම වැඩසටහන්වලදී ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම හා බලය ක්‍රියාත්මක වූයේය.




*Pr. S. Sam Selva Raj's Speech in Open-Air Meeting*

,

## නෙහෙමියා බයිබල් විදුහල

සභාවේ සේවාවන් සහ ළමා සේවාවන් ඉතා අනර්ඝ ලෙස පවත්වන්නට හැකි විය. 2025 ජුනි මාසයේ සිට පුරා වසරක ඩිප්ලෝමා පාඩම් මාලාවක්ද අප ආරම්භ කළෙමු.

1. හින්දි භාෂාවෙන් නවාතැන් පහසුකම් ද සමඟ වේලච්චේරිවල අප බයිබල් පාඩම් මාලාවක් පවත්වමු. මෙය හැදෑරීමට කැමති දෙවියන්වහන්සේ ගේ සේවයට කැප වූ අයට මෙයට සහභාගි වීමට හැකිය.
2. දමිළ භාෂාවෙන් සවස් කාලීන බයිබල් විදුහල් පාඩම්මාලාවක් පවත්වමු. මෙම පාඩම් මාලාව සෑම සඳුදා, අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා යන දිනයන්වලදී සවස 6.30 සිට 8.30 දක්වා පවත්වමු.

මෙම සියලු පාඩම් මාලාවන් පවත්වන්නේ චේපාක් හා සන්තෝෂ පුරම හි බයිබල් විදුහල්හිය. තවද, වේලචේරිවල තවත් පාඩම් මාලාවක් 2025 සිට 2026 වන වසර

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

සඳහා දමිළ භාෂාවෙන් පවත්වමු. මේ සියලුම වැඩසටහන් නිසා ඔබගේ යාච්ඤාව අප අගය කරමු.

## කැඳවීමේ ප්‍රතිරාවය ඩිජිටල්කරණය කිරීම:

2026 වන වර්ෂයේදී අප බලාපොරොත්තු වන්නේ, **කැඳවීමේ ප්‍රතිරාවය** ඩිජිටල් ක්‍රමය තුළින් ඔබ වෙතට එවීමටයි. මන්ද තැපැල් ගාස්තු හා මුද්‍රණ ගාස්තු සියල්ලම අහස උසට නැග ඇති නිසා මෙවැනි ආර්ථික තත්ත්වය තුළ මෙම වියදම අපට දැරීමට අසීරු වී තිබෙන බැවින් අප WhatsappE-mail සහ සමාජ මාධ්‍ය ජාලය හරහා ක්‍රියා කිරීමට බලාපොරොත්තු වෙමු. ඒ උදෙසා ඔබගේ තොරතුරු පහත සඳහන් කරුණු යටතේ අප වෙත එවන්න.

1. ඔබගේ ලිපිනය:
2. ඔබගේ දුරකථන අංකයේ සහ Whatsapp අංකය:
3. ඔබගේ Email ලිපිනය:

කරුණාකර මෙම තොරතුරු ඉතා පැහැදිලිව අප වෙත ලියා එවන්න. එසේ නොමැති වුවහොත් ඔබට ඉදිරියේදී මෙම සඟරාව නොලැබීමට පුළුවනි. දැනටම ඔබ කැඳවීමේ ප්‍රතිරාවය සේවය සමඟ සම්බන්ධතාවය ඇති කරගෙන සිටී නම් ඔබට මෙය අදාළ වන්නේ නැත.

## කැඳවීමේ ප්‍රතිරාවය සඳහා අපගේ යාච්ඤා ඉල්ලීම්;

පහත සඳහන් කර තිබෙන කාරණා සඳහා ඔබගේ යාච්ඤා අප බලාපොරොත්තු වෙමු.

### ජාත්‍යන්තර යෞවන වීරයන්ගේ සේවය

1. තරුණයන් හා දරුවන් උදෙසා ගෝලීමයව විනාඩියක යාච්ඤාව සහ මෙම දර්ශනය උදෙසා දිනපතා රාත්‍රී 10.00ට පවත්වන යාච්ඤාව ගැන යාච්ඤා කරන්න.
2. ලෝකයේ තිබෙන සභා සහ ඇදහිලිවන්තයින් උදෙසා පැයක දම්වැල් යාච්ඤාව
3. සෑම දෙනාගේ ආත්මික වර්ධනය උදෙසා පවත්වන්නා වූ කඳවුරු, ආත්මික වැඩමුළු සහ සම්මේලන උදෙසා යාච්ඤා කරන්න.

අපගේ සියලුම මිෂනාරිවරුන්ත ඉතා ආදරයෙන් ආරාධනා කරනවා මේ සියලු සේවාවන් සඳහා එකතු වන පිණිස.

## නිවාඩු කාලීන බයිබල් පාඩම් මාලාව - 2025 මැයි මස

අපගේ සභාවන්වල නිවාඩු කාලීන බයිබල් පාසල පවත්වමු. ඒ උදෙසා යාච්ඤා කරන්න.

චෙන්නෙයි සභාවේ නිවාඩු කාලීන බයිබල් පාඩම් මාලාව

1. සන්තෝෂපුරම්
   අප්‍රියෙල් 25 සිට මැයි 1 දක්වා
2. වේලච්චේරිවල
   අප්‍රියෙල් 30 සිට මැයි 5 දක්වා
3. බාලාජිනගර්,පල්ලි කරණෙයි
   අප්‍රියෙල් 30 සිට මැයි 5 දක්වා
4. චේපාක්
   මැයි 6 සිට මැයි 12දක්වා

කරුණාකර මේ සියලුම දේ උදෙසා යාච්ඤා කරන්න.
කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ කණ්ඩායම

In His Service,
*ECHO OF HIS CALL TEAM*
E.mail : sam@echoofhiscall.org

**Pray for**
**URGENT NEED**
**for**
**CHRISTIAN OFFICE**

**1. COMPUTER OPERATORS**
**2. PRINTING PRESS OPERATORS**

**Contact : (+91) 98412 71858, E.mail : sam@echoofhiscall.org**

**NOTICE**

Please store the Mobile Phone numbers (+91) 98410 71858, (+91) 98412 71858 of Pastor S. Sam Selva Raj on your mobile phones. - Editor




**ඉතා හදිසි දැනුම් දීමක්!**

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echoofhiscall.org

1 පිටුවෙන්....

නැතිවූ පුත්‍රයා පිළිබඳව ඇති උපමා කතා අතරින් නැති වූ බැටළුවා ගැන කියවන සෑම අවස්ථාවකදීම මගේ මනසට පැමිණි ප්‍රශ්නය වූයේ; ''එඬේරා බැටළුවන් අනූනව දෙනාව හැර දමා ගියේ ඇයි?'' යන්නයි. ඔහු අනූනව දෙනා ගැන සැලකිල්ලක් දැක්වූයේ නැද්ද? නැතිවූ බැටළුවා වටින බව මා දනිමි. නමුත් ඔහු අනූනව දෙනා හැර දමා ගියේ ඇයි? ඔබ ඔවුන් ගැන කල්පනා කර තිබේද? ***අනූ නවය, කාසිනවය සහ වැඩිමහල් සහෝදරයා. 99:9:1.***

ඔබත් එවැනි තත්ත්වයක සිටියා නම් ඔබ අනූනව දෙනා අත්හැර එක්කෙනෙක් සොයාගෙන යනවාද? ඔහු ඔවුන්ව හැරදමා ගියා පමණක් නොව; පාළුකරෙහි ඔවුන්ව හැර දමා ගියේය. එය මට තවත් ගැඹුරින් සිටීමට පුළුවන් විය. එය ආරක්ෂිත ස්ථානයක් ද නොවීය. ඔහු ඔවුන්ව ආරක්ෂිත ආවරණයක් තුළ තැබුවේ ද නැත.

ඔවුන් එළිමහන් ප්‍රදේශයක් වන සත්වයින්ගෙන් හා වෙනත් අනතුරු වලින් ගහනය වී සිටියෝය. එක්කෙනෙක් සොයන විට අනෙක් අනූනව දෙනාම නැති වෙන්නට තිබුණි.

මා සිතන්නාවූ ආකාරයට වෙනත් කෙනෙක් මේ පිළිබඳව සිතා ඇත්දැයි කියා මා නොදනිමි. සමහර විට තරුණ බැටළුවා කුතුහලයෙන් ගවේෂණය කිරීමට ආශාවක් හා උනන්දුවක් ඇති නිසා අතරමන් වෙන්නට ඇත. එසේත් නොමැති නම් සමහර විට කැරලිකාර හෝ අකීකරු වන්නට ඉඩ ඇත. එඬේරාගේ මග පෙන්වීම නොසලකා හරිමින් සෑම විටම ඉබාගතයේ යන්නටද ඇත.

මෙයට හේතුව කුමක් වුවත් එඬේරා 99 දෙනා පාළුකරයෙහි තනිකර දමා යාමට කැමැත්තෙන් සිටි අතර නිරාවරණය වූ සහ අවදානමට ලක්විය හැකි වුවත් එය පසුකර යාමට අවධානමකට ලක් වීමකි.

## 99 ගැන එඬේරාගේ විශ්වාසය



### (1). එක්සත්කමේ බලය

එනම් මාගේ ගෘහයෙහිද මාගේ භිත්ති ඇතුළෙහිද පුත්‍රයන්ටත් දූවරුන්ටත් වඩා සිහිවීම් ලකුණක්ද නාමයක්ද ඔවුන්ට දෙන්නෙමි; සිඳී නොයන සදාකාල නාමයක් ඔවුන්ට දෙන්නෙමි.



*The power of unity!*

විවෘත වූ පාලුකරයෙහි අනූනව දෙනා හැර දමා යාමට එඬේරාට මහත් විශ්වාසයක් තිබෙන්නට ඇත. සෑම විටම ඔවුන් එකිනෙකාට සහයෝගය දැක්වීමෙන් හා ඔවුන් එකිනෙකා වෙනුවෙන් කැපවී එකමුතුව සිටින බවත් අනතුරු වලට මුහුණ දෙන විටදී වුවද ඔවුන් බලවත් බලවේගයක් ලෙස එක්සත් වීමට හැකි බවත් ඔහු දැන සිටියා විය හැක.

එඬේරා ඔවුන්ව එකමුතුකමේ බලය තුළ ඉතා හොඳින් පුහුණු කර ඇති බව මා හට විශ්වාසයි. එක් බැටළුවකට පහර දුන්නේ නම් අනෙක් 98 දෙනාම ඔහුගේ ආරක්ෂාව පිණිස නොසැලී ශක්තිමත්ව සිටිමින් ආරක්ෂා කරනු ලබයි. මන්ද එක්සත් භාවය කරණ කොට ගෙන උතුම් බලයක් තිබේ.

එසේම එඬේරා; නැති වූ බැටළුවා අනාරක්ෂිතව තනිව සිටී කියාත් ඔවුන්ට උපකාර කිරීමට ආරක්ෂා කිරීමට කවුරුත් නැති බවද දැන සිටියේය. එවැනි තනිව සිටින විටදී සුරක්ෂිව සිටීමට අපහසුය. පිටස්තරින්න එන තර්ජන පමණක් නොව තනිවී සිටීමේ අමාරුකමත් ඉතාම භයානකයි. ඒ නිසා දේව වචනය අපට පවසන්නේ; ''එක්සත්ව සිටින්න'' කියායි.

***''නැවතත් නුඹලාට කියමි: පොළොවේදී නුඹලාගෙන් දෙදෙනෙක් තමුන් ඉල්ලන යමක් ගැන එක්සිත් වන්නෝ නම්, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් වහන්සේගෙන් ඒ දේ ඔවුන්ට ලැබෙන්නේය.'' (මතෙව් 18:19)***

***''මක්නිසාද දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටිත් නම් මම එතැන ඔවුන් මැද සිටිමි.'' (මතෙව් 18:20)***

***''බලව, සහෝදරයන් එකඟව වාසය කිරීම කොපමණ යහපත්ද, කොපමණ ප්‍රසන්නද!'' (ගීතාවලිය 133:1)***

බොහෝ අවස්ථාවන්වලදී අප මනුෂ්‍යයන් අතර සිටින විටදී ඔවුන් යහපත්ය කියා අප සිතමු. අපව

....Contd. to page 6

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මැයි:19-** අපගේ ළමුන්ගේ නිවාඩු කාලීන බයිබල් පාසලට දෙවියන්වහන්සේ මහත් ලෙස ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**මැයි:20-** අපගේ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විදුහල සහ දේව ධාර්මික තැපැල් මාර්ගික පාඩම් මාලාව අවශ්‍යතා ඇති අයට සේවය කිරීමට කැපවී සිට නිසා ස්තුති කරන්න.

**මැයි:21-** අපගේ පරිවර්තකයින්, කර්තෘවරු සම්බන්ධීකාරකවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට දිව්‍යමය අනුග්‍රහය ලැබී තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:22**- අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල සියලුම සාමාජිකයින්ට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:23 -** දේශපාලන හා ආගමික විරුද්ධතාවයන් හමුවේ වුවද අපගේ කිතුණු සේවාවන්වල වර්ධනයක් ඇතිවී තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:24-** අවුල් වියවුල් සහ යුද්ධමය තර්ජන මධ්‍යයේ සියලුම ජාතීන් කෙරෙහි දෙවියන් වහන්සේගේ දිව්‍යමය ආරක්ෂාව නිසා ස්තුති කරන්න.

**මැයි:25-** අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලයේ පුරා හවුල්කරුවන් හා මහා ආඥාවේ හවුල්කරුවන්ගේ පවුල් සමග දෙවියන් වහන්සේගේ කරුණාව වැගිරෙව් නිසා ස්තුති කරන්න.

**මැයි:26-** අපගේ විනාඩි 5ක YouTube පණිවිඩය හරහා ඒ අසන සංඛ්‍යාව සහ සාක්ෂි මෙතෙක් වැඩි වී තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:27-** 2025 මාර්තු 23 වන දින ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලෙහි පැවැත් වූ අපගේ ගැලවීමේ රැස්වීමට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**මැයි:28-** අපගේ බයිබල් පාඩම් මාලාව (තැපැල් මාර්ගික පාඩම් මාලාව) සහ දේවධාර්මික තැපැල් මාර්ගික පාඩම් මාලාව හරහා බලපෑමක් ඇතිවී තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:29-** අපගේ සියලුම දේව සේවයේ අවශ්‍යතා සියල්ලම උන්වහන්සේ හාස්කම් තුළින් සපයා තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:30-** සමාජයේ සිටින්නා වූ සෑම තරාතිරමකම කාන්තාවන් සවි බල ගන්වා තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:31-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ කාර්යමණ්ඩලය සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් ගේ ආරක්ෂාව සහ යහ පැවැත්ම නිසා ස්තුති කරන්න.

**ජූනි:01-** ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසල සහ නෙහෙමියා බයිබල් විදුහල 2025 සිට 2026 වැනි අධ්‍යයන වර්ෂයට ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුවූ නිසා ස්තුති කරන්න.

**ජූනි:02**- දේව ධර්ම සම්මන්ත්‍රණ නිතිපතා පැවැත්වීමට දෙවියන් වහන්සේගේ කරුණාව අපට ලබා දීම නිසා ස්තුති කරන්න.

**ජූනි:03-** 1969 වන වසරේ සිට අපගේ සඟරාවේ සේවයට නොකඩවාම උන්වහන්සේ කළ ආශිර්වාද නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූනි:04-** ජාතීන් අතර සමාදානය ඇතිවෙන පිණිස හා ආර්ථික වර්ධනය උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:05-** අපගේ විවිධ සේවාවන්වල විවිධ හැකියාවන් සහ දාරිතාවය පුළුල් වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:06-** කිතුණුවන් දේව වචනයට අනුව ජීවත්වීමට සහ ක්‍රිස්තුස් වහන්සේ වැනි චරිතයක් ඇතිව වර්ධනය වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:07-** ලෝකය පුරා තිබෙන කිතුණු අධ්‍යාපනික ආයතන වල යහපත් නාමය හා එය නොකඩවාම පවත්වාගෙන යන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:08-** යාච්ඤාවෙන් හා මූල්‍යමය අතින් උපකාර කරන්නන්, සුභ පතන්නන් සහ මිත්‍රයින්ට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලබා දෙනු පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:09-** පොළොවෙහි තිබෙන දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඉදිරියට ගෙනයන පිණිස නැවුම් දර්ශනයක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:10-**සියලුම කිතුනු සභාවන්ට විරුද්ධව ක්‍රියා කරන ආත්මික සහ භෞතික තර්ජන වලට එරෙහිව දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:11-** සෑම පවුලකම සමගිය සහ සමාදානය උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:12-** ලොව පුරා රූපවාහිනිය සහ YouTube නාලිකාව හරහා දේශනා කරන දේශකයින්ව ආලේප කර ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:13-**- අපගේ ප්‍රධාන දේවගැති එස්. සෑම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් සෑමටම යහපත් සෞඛ්‍ය තත්ත්වයක් සහ දිව්‍යමය රැකවරණය ලබා දෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:14 -** ලොව පුරා ජාතීන් අතර සෑම අංශයකයින්ම සමගිය හා ප්‍රගතියක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:15-**- අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන් ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන්, මහා ආඥාවේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල් කෙරෙහි දෙවියන් වහන්සේගේ කරුණාව ලැබෙනු පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:16-**- අපගේ සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වලට යහපත් සෞඛ්‍යයක් සහ යහ පැවැත්මක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:17-**- ලොව පුරා රටවල සිටින ජනාධිපතිවරු, අගමැතිවරු සහ රජයේ සියළුම බලයලත් නිලධාරීන් ප්‍රඥාවෙන් සහ අවංක භාවයෙන් යුතුව නායකත්වය දෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:18-**- බොහෝ සෙයින් ව්‍යාප්තව පවතින උණ සහ බෝවන රෝග වලට එරෙහිව දිව්මය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4


පිළිගන්නේ නැති, අපව තේරුම් ගැනීමට නොහැකි, අපට අවංකව ප්‍රේම නොකරන හා අපට දුක් දෙන අය සමඟ සිටීමට වඩා තනියම සිටින එක හොඳයි කියා අප සිතමු.

නමුත් ප්‍රිය සහෝදරයා සහෝදරිය, ඔබ මෙවැනි අත්දැකීම් ලබා තිබුණත්, මේවා තුළින් ගමන් කර තිබෙනවා නම්; ''ස්වාමීන් වහන්සේ ඔබගේ තුවාල සුව කරන්නය" කියා මා යාච්ඤා කරමි. යේසුස් වහන්සේව පාවා දුන් විටදීත් උන්වහන්සේ කුරුසියේ සිටින විටත් උන්වහන්සේ වින්ද වේදනා නිසා, ඔබගේ වේදනාවන් උන්වහන්සේ හොඳින්ම දනී.

මේ ලෝකයෙහි සිටින මනුෂ්‍යයන් විශ්වාස කිරීම අමාරුයි. ඉතාම කණගාටුදායක දෙය නම්; මේ දේ නිසා සෙනඟ දේවස්ථානයට පැමිණෙන්නේද නැත. ඔබ වටකර සිටින්නවූ සෙනඟ නිසා ඔබ සභාවට යන්නේ නැතිනම්; මා ඔබව ධෛර්යමත් කරනවා ඔබ ඔබගේ සභාවට යන ලෙස, මන්ද මෙය දෙවියන්වහන්සේගේ අණකි.

***''සමහරුන්ගේ පුරුද්ද ලෙස අපේම රැස්වීම අත් නෑර, ළංවන බවට තුඹලාට පෙනෙන ප්‍රකාරයට වඩ වඩා එකිනෙකාට අවවාද කරමු." (හෙබ්‍රෙව් 10:25)***

සභාවෙන් ඈත්වී ජීවත්වෙන්න එපා. අප මේ ලෝකයේ අසම්පූර්ණ මනුෂ්‍යයන් සමඟ ජීවත් වෙමු. නමුත් දෙවියන් වහන්සේ සම්පූර්ණය. උන්වහන්සේ අපට කරුණාවත් ප්‍රේමයත් ප්‍රඥාවත් දෙන සේක. ක්‍රියා 15 වන පරිච්ඡේදයෙහි සභාව එක්සත්කමින් යාච්ඤා කළ විටදී දෙවියන් වහන්සේ ඉතා පුදුමාකාර ලෙස හිර ගෙවල්වල දොරවල් විවර කර පේතෘස්ව එළියට ගෙන



***God miraculously opened the prison doors for Peter.***

ආවේය. ඇදහිලිවතුන් එක්සත්ව යාච්ඤා කරන විටදී මහත් බලයක් අත්දැකීමට හැකිවිය. දෙවියන් වහන්සේ පේතෘස් සිටි හිරගෙදර දොරවල් පුදුමාකාර ලෙස විවර කළේය.

අප එකිනෙකාට ප්‍රේම කළ යුතුයි. මන්ද, ප්‍රේමය කරන කොටගෙන බොහෝ දේ සිදුවන්නට පුළුවනි. ඉංග්‍රීසි භාෂාවෙන් මෙසේ කියමනක් තිබේ; ''ඔබට වේගයෙන් ඇවිදින්නට අවශ්‍ය නම්, තනියම ඇවිදින්න නමුත් ඔබට දීර්ඝ ගමනක් ඇවිදින්නට අවශ්‍ය නම් තවත් කෙනෙක් සමග ඇවිදින්න.'' කෙසේ වෙතත් අප ඇවිදින්නට ඕනේ කා සමඟද? අප සහභාගිකම් පවත්වන්න ඕනේ කා සමඟද? කියා අප ප්‍රවේශමෙන් තෝරා ගත යුතුයි. ගීතාවලිය පළමු වෙනි පරිච්ඡේදයෙහි සමහර දේවලින් අපිට ප්‍රවේසම් වන්නේ කියා පවසන්නේ මේ නිසාය. මන්ද වැරදි ඇසුරක් තිබෙන විටදී එහි අවසානය අපගේ විනාශයයි.

යේසුස්වහන්සේ ඉතා අලංකාර ලෙස යාච්ඤා කළේය. ***''අප ඒකත්වයක්ව සිටින්නා සේම ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් මහිමය ඔවුන්ට දුනිමි. මෙසේ කෙළේ මා ඔවුන් තුලෙහිද ඔබ මා තුලෙහිද සිටීමෙන් ඔවුන් ඒකත්වයට සම්පූර්ණ ලෙස පැමිණෙන පිණිසත් ඔබ මා එවූ බවද මට ප්‍රේම කළාක් මෙන් ඔවුන්ටත් ප්‍රේමකළ බවද ලෝකයා දැනගන්නා පිණිසත්ය.'' (යොහාන් 17:22-23)***

එඬේරා නැති වූ බැටළුවන් සොයමින් ගිය අතර දෙවියන් වහන්සේගේ කරුණාවෙන් සොයා ගත් විට, ඉතිරි අනූනව දෙනාම තමා සමඟ සිටිමින් නැති වූ කෙනෙක් නැවත පැමිණ විට ඔහු මහත් ප්‍රීතියට පත්විය. මෙයින් අපට පෙනෙන්නේ; අප එකිනෙකා දෙවියන් වහන්සේ ඉදිරියේ ඉතා වටිනා අය බවයි. අප නැති වූවන් නැවත උන්වහන්සේ වෙතට පැමිණෙන විට ස්වාමීන් වහන්සේ තුළ සිටින අය සමඟ සතුට භුක්ති විඳීමට පුළුවනි.

....Contd. to page 9

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

Pray for

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE REACHING NATIONS

**NEHEMIAH BIBLE COLLEGES,**

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Qualification : 10th Standard & above

**RUSH FOR ADMISSION!** Medium : Tamil (Part Time)

**Diploma in Theology** Hindi (Residential) (Sponsorship Available)

Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.

Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org





# අතහරින්න එපා! ආපසු ගන්න එපා!

''ඉදින් මාගේ ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත් වේ. නුමුත් ඔහු පසුබට වන්නේ නම්, මාගේ ආත්මය ඔහු කෙරෙහි ප්‍රසන්න නැත. නුමුත් අපි වනාහි විනාශ වන ලෙස පසුබටවීමට නොව ප්‍රාණය ගැලවෙන ලෙස ඇදහීමට අයිතිවමුව.'' (හෙබ්‍රෙව් 10:38- 39)

මගේ සේවා මුල් කාලයේදී කිසි කෙනෙකුගේ උදව් උපකාරයක් නොමැතිව සිටි නිසා මා විශාල පීඩාවන්ටත්, බොහෝ අමාරුකම් වලටත් මුහුණ දුන්නෙමි. බොහෝ රාත්‍රීන් නින්ද නොමැතිව බියෙන් සිටි අවස්ථාවන් වලදී දෙවියන්වහන්සේගෙන් ප්‍රශ්න කරමින්; ''සැබැවින් උන්වහන්සේ මාව කැඳවා තිබෙනවාද? නැතිනම් මගේ ස්වාමීන් වහන්සේගේ කැමැත්තට අනුව මා සේවයට පැමිණියාද?'' කියා ඇසුවේය.

බොහෝ අවස්ථාවන්වලදී මා බඩගින්නෙන් සිටි අතර ශාරීරිකවද මා පහර ලැබුවෙමි. මේ සෑම දේ තුළින්ම දෙවියන් වහන්සේ නිහඬව සිටියේය. මගේ යාච්ඤාවන් වලට පිළිතුරක් තිබුණේද නැත. බොහෝ අවස්ථාවන්වලදී මම අත්හරිනු ලැබූ තත්ත්වයකට පත් වූ වෙමු. නමුත් කාලය ගත වූ විට මා තේරුම් ගත් දෙය නම්; උන්වහන්සේගේ නිහඬතාවය මගේ පිළිතුර කියාය. මන්ද මේ ලෝකයේදී මට සිදුවූ කරදර තුළින් උන්වහන්සේම මට යමක් ඉගැන්නුවේය.

1979 වර්ෂයේදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය දේශනා කරන විට මට විරුද්ධව මහත් විරෝධතාවයන් ඇති විය. මා දේව මෙහෙය පැවැත්වූයේ කුලියට ගත් ස්ථානයකය. සමහර අය මගේ නිවසේ අයිතිකරු වෙතට ගොස් මට විරුද්ධව බොරු චෝදනා කරමින් දේව මෙහෙය නවත්තන්නය කියා පවසා තිබූ හෙයින් මගේ හදවත බොහෝ සෙයින් කඩා බිඳ වැටුණි. මා හඬන ශබ්දය කිසිවෙකුට නොඇසෙන පිණිස මා නිවස වසාගෙන මුළුතැන්ගෙයි සහ නාන කාමරයේ තිබූ වතුර කරාම ඇර දෙවියන් වහන්සේ ඉදිරියෙහි හඬා වැටුනෙමි.

මගේ ජීවිතය දෙස බලන විට, එක් අතකින් මට අභියෝග සහ ප්‍රශ්නකාරී බොහෝ දේ තිබුන අතර අනෙක් පැත්තෙන් මාව කැඳවූ දෙවියන් වහන්සේ මා වෙනුවෙන් කිසිවක් කළේද නැත. ඒ නිසා මට විරුද්ධව තිබූ විරුද්ධතාවයන් ශක්තිමත් විය. බොහෝ අය මට ඔච්චම් කළේය. මා රැකියාව කළ රජයේ කාර්යාලයේ සමහර අයද මට විරුද්ධව බොරු චෝදනා එල්ල කළේය.

මේ නිසා මා ඉතා අසීරු තත්ත්වයට පත්විය. ඒ අය මට මොනවා හරි දෙයක් කරයි කියා බියවීමි. මෙවැනි අමාරු අවස්ථාවලදී මා දෙවියන්වහන්සේට මෙසේ මොරගැසුවෙමි.

''ඊශ්‍රායල්හී දෙවිතුමනි, ආබ්‍රහම්ගේද ඊසාක්ගේ ද යාකොබ් ගේද දෙවියන්වහන්ස ඔබගේ මේ නිහඬතාවය මට තවදුරටත් දරා ගැනීමට නොහැකිය. ඔබවහන්සේ මා උදෙසා සිටගත්තේ නැතිනම් මා උපකාර ලබා ගන්නා පිණිස කා ළඟට යන්නෙමි ද? ඔබවහන්සේ මාව ආරක්ෂා කළේ නැතිනම් මට පිහිටක් ලැබෙන්නේ වෙන කොහෙන්ද?” කියා මොර ගැසුවෙමි.

එහෙත් මට පිළිතුරක් හෝ මගේ පෙන්වීමක් ලැබුණේ නැති අතර ලැබුණේ, නිහඬතාවය පමණකි. මගේ ආත්මය කැළඹුණේය. එදා රාත්‍රියේදී මගේ සෑම දේම මා සූදානම් කරගෙන මා සිටි ස්ථානය හැර දමා නැවත මගේ ගමට යාමට තීරණය කළෙමි.

''පීඩා කරන කඩුවට බයින් ඔවුහු තම තමුන්ගේ සෙනග වෙතට හැරී තම තමන්ගේ දේශයට පලායන්නෝය.'' (යෙරමියා 50:16)

හරියටම අළුයම 2.00 ට පමණ කිසියම් කෙනෙක් මා සිටි නිවසෙහි දොරට තට්ටු කරන හඬ ඇසුනි. මා ඉතා බයෙන් වෙව්ලන්නට පටන් ගත්තෙමි. මා මෙසේ වෙව්ලමින් දොර හරින විට මා ඉදිරිපිට ඉතා වයසක මනුෂ්‍යයෙක් තමාගේ අතේ බෑගයක් සහ කෑම පාර්සලයක් අතැතිව සිටගෙන සිටියේය මා ඔහුගෙන්; ''ඔබ කවුද? මේ වෙලාවේදී මෙහෙ ආවේ කුමකටද? දෙවියන් වහන්සේ මගේ යාච්ඤාවට පිළිතුරු නොදුන් නිසා මා මගේ ගමට යාමට සූදානමින් සිටින්නෙමි.” කියා ඔහුට කීවිමි. ඔහු මගේ නිවස ඇතුලට එන්නට ඕනිය කියා මට කරදර කළේය. අසල්වාසීන් මෙය දුටුවහොත් කිසියම් කරදරයක් ඇති වෙයි කියා සිතා මා ඔහුට ඇතුළට එන පිණිස අවසර දුන්නේය.

ඔහු කතා කරමින් ''මගේ පුත්‍ර වූ සෑම්, මා ඔබගේ මිත්‍ර වූ පාස්ටර් ජේ. එස්. ඩෑනියල්ය. ඔබව හමුවී වසර ගණනාවක් ගෙවී ඇත. සමහර විට ඔබට මාව අමතක වී ඇතැයි කියා මා සිතමි මා නගරයේ සේවයක් හමාර කොට නැවත නිවසට යාමට සූදානම් වූවත් මට එහි යන පිණිස තිබූ බස් රථය ගොස් තිබුණි. කුලී රථයක යාමටද මා අත මුදල් තිබුනේද නැත. මට නගරයේ නිදා ගැනීමටද කිසිදු තැනක් තිබුණේ නැත. මම පාරේ ඇවිදගෙන එන විට දෙවියන්වහන්සේ මට මග කතා කරමින් ඔබ ළඟට යන පිණිස මග පෙන්නුවේය. ඔබ මෙම ස්ථානය අතහැර දමා යාම හොඳ නැත. ඔබව කැඳවූ දෙවියන් වහන්සේ නිහඬව සිටින්නට පුළුවනි. නමුත් උන්වහන්සේ යහපත් හෙට දවසක් උදෙසා ඔබව සූදානම් කරමින් සිටියි. ඔබගේ ජීවිතේ බලවත් දේ ලබාගන්නා පිණිස ඔබව පුහුණු කරයි. උන්වහන්සේ නිහඬව නොසිටින බව මතක තබා ගන්න. සුභාරංචිය ගමන් කිරීම ආරම්භ වන්නේ යෙරුසලමේ සිටය. (යෙසාය 2:3/මීකා 4:2) ඔබ සිටින ඔබ සිටින ස්ථානය ඔබගේ යෙරුසලමයි. එබැවින් මෙම ස්ථානය අතහැර නොයන්න.''

මට කිරීමට වෙන කිසිම දෙයක් නොතිබුණු නිසා මා ඔහුට කීකරු විය. දෙවියන්වහන්සේ මට ප්‍රේම කරමින් උන්වහන්සේගේ ඉතාම යටහත් පහත් දේවදාසයෙක් මා ළඟට එව්වේය. මා කිරීමට ගිය ක්‍රියාව නිසා මා දෙවියන් වහන්සේ ගෙන්ද පාස්ටර් ඩෑනියෙල් ගෙන්ද මගේ ක්‍රියාවට සමාව ලබා ගත්තෙමි. මගේ සේවය මා

දිගටම කරගෙන ගිය අතර දෙවියන්වහන්සේ මට ආශිර්වාද කළේය. එම ස්ථානයෙන් උන්වහන්සේ වෙනත් ස්ථානයකට මාව ගෙන ගියේය. එහිදී උන්වහන්සේ මගේ සේවයට බලවත් ලෙස ආශිර්වාදයන් ගෙන ආවේය.

මාගේ ප්‍රිය මිත්‍රය, ඔබව කැඳවූ දෙවියන් වහන්සේ ඔබව අමතක කළාය කියා ඔබ සිතනවාද? ඔබගේ සේවයේ වර්ධනය ඉතා සෙමින් සිදුවන්නේ කියා සිතනවාද? ඔබ සිටින ස්ථානය හැර දමා වෙනත් ස්ථානයකට යන්න සූදානම් වෙනවද? නැත, ඔබ ඒ දේ කළ යුතු නැත. ඔබව කැඳවූ දෙවියන්වහන්සේ විශ්වාසවන්තව සිටී. ඔබ සන්තක සියලු දේ නැති වුවත් ඔබට යහපත් අනාගතයක් උන්වහන්සේ තබා තිබේ. උන්වහන්සේගෙන් හාස්කමක් බලාපොරොත්තු වෙන්න. යහපත් දෙයක් ඔබගේ ජීවිතයෙහි සිදුවෙයි.

''ස්වාමීන් කෙරෙහි බලාසිටුව. ශක්තිමත් වේව, තාගේ සිත ධෛර්යමත් වේවා; එසේය, ස්වාමීන් කෙරෙහි බලා සිටුව.'' (ගීතාවලිය 27:14)

************

6 පිටුවෙන්....

## (2). අවදියෙන් සිට ප්‍රතිශංස්කරණය කිරීමට කැඳවීමක්

එඬේරා බලාපොරොත්තු වූයේ බැටළුවන් 99 දෙනාම ඉතා අවදියෙන් හා පරිස්සමෙන් සිටින පිණිසයි. මෙම අනූනම දෙනාටම මහත් වූ වගකීමක් දරා ගැනීමට සිදුවිය. එක් බැටළුවෙක් නැතිවූ බව එඬේරා දැනගන්නේ කෙසේද? සැබැවින් මේ 99 දෙනාගෙන් එක්කෙනෙක් මේ සම්බන්ධව සංඥාවක් දෙන්නට ඇත. සමහරවිට නැතිවූ බැටළුවාගේ මව, සහෝදරයා හෝ සහෝදරිය, මිත්‍රයා, සීයා නැතිනම් ඒ කෙනාගේ බිරිඳ හෝ ස්වාමියා වෙන්නට ඇත. කවුරුන් හෝ කෙනෙක් යම්කිසි ආකාරයෙන් නැති වූ බැටළුවා ගැන පණිවිඩයක් දෙන්නට ඇත.

යේසුස්වහන්සේගේ බලාපොරොත්තුව වන්නේ; ඉතිරිව සිටින 99 දෙනා ඉතා අවධියෙන් සිටියා වගේ හා එම අනූනව දෙනාම නැති වූ බැටළුවා ගැන වගකීමක් තිබුණා වගේ අපගේ පවුලේ සාමාජිකයින්, මිත්‍රයින් හා සභාවේ සිටින සෙනඟ ගැන ඉතා අවදියෙන් ක්‍රියා කරමින් ඔවුන්ව ප්‍රබෝධමත් කිරීමට අප සූදානම්ව සිටිය යුතුයි. තවද අපි නිතරම ඉතා ඕනෑකමින්, අවධානයෙන් මුරකරුවකු ලෙස සිටිය යුතුයි.

*''.......එසේම, මනුෂ්‍ය පුත්‍රය, මම නුඹ ඊශ්‍රායල් වංශයට මුරකාරයෙකු කෙළෙමි; නුඹද මාගේ මුඛයෙන් වචනය අසා, මාගේ නාමයෙන් ඔවුන්ට අවවාද කරපන්න.'' (එසකියෙල් 33:3-9)*

දෙවියන්වහන්සේ ඔබවත් මාවත් 99 දෙනා අතරෙහි තබා අන් අයට මුරකාරයෙක් ලෙස බොහෝ ස්ථානවල තබා තිබේ. අප මුරකාරයෙක් ලෙස අවදියෙන් සිටිය යුතු සෙනඟකි.

## (3). උදාසීනත්වයට සහ ස්වයං නිවැරදි භාවයට එරෙහිව අනතුරු ඇඟවීමකි.

සමහර විටදී අප 99 දෙනාගේ කොටසක් වීම, ආරක්ෂාව සහ ආරක්ෂාව දැනීමකි. මෙය උදාසීනත්වයට සහ ස්වයං ධර්මිෂ්ටකමට තුඩුදිය හැකිය. සමහර අවස්ථාවන්වලදී 99 දෙනා අතරේ සිටින විට අප ඉතා ආරක්ෂා සහිතයි කියා සිතමු. මෙවැනි සිතුවිලි සමහර විට අපට එය ස්වයං නිවැරදි

**ECHO OF HIS CALL** YouTube LIKE COMMENT

**කැඳවීමේ ප්‍රතිරාවය සේවය. දිනපතා මෙනෙහි කිරීමේ ප්‍රතිචාර**



Bro. Shashi Tiwari



Bro. Stephen Ramana

**1). සහෝදර ස්ටීවන් රාමනා - දකුණු අප්‍රිකාව**

අද උදෑසන ලැබුණු පණිවිඩය ඉතාම බලවත්තයි. මන්ද මා සැබවින්ම ආශිර්වාද ලද්දෙක් වෙමි .

**2). සහෝදර ශෂී තිවාරි - මුම්බායි**

ධෛර්යමත් කිරීමේ මෙනෙහි කිරීම නිසා ස්තුතියි. මෙනෙහි කිරීම හා පරිවර්තකයා නිසා දිනපතා යාච්ඤා කරමි.

**3). සහෝදර ශාවුල් බෙන්ජමින් සිඩ්නි**

ස්වාමීන් වහන්සේට ස්තුති වේවා පාස්ටර්, මම දිනපතාම Youtube නාලිකාව හරහා ඔබගේ පණිවිඩය අසමි. ඔබගේ පණිවිඩය තුළින් දෙවියන් වහන්සේ මට ආශිර්වාද කරයි. ඒ නිසා දෙවියන් වහන්සේට ස්තුති කරන අතර දෙවියන් වහන්සේ ඔබට තව තවත් ආශිර්වාද කරයි.

**4). සහෝදරී මේරි සුසෑන් - විසාග්**

YouTube නාලිකාව තුළින් උදෑසන විකාශනය වන පණිවිඩය නිසා ස්තුතියි. සැබැවින්ම මා ආශිර්වාද ලද්දියක්මි.



Sis. Mary Susan



Bro. Shaul BenjaminShinde

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

භාවයකට හෝ ස්වයං ධර්මිෂ්ඨ කමට පත්කිරීමට පුළුවනි. මා බලාපොරොත්තු වෙන දේ මා කරමි. මා බැටළු රැළ සමග සිටිමි. මා එඬේරාට කීකරු වී ඔහුව අනුගමනය කරමි. නැති වූ බැටළුවා මෙන් මා වැරදි මාර්ගයේ යන්නේ නැහැ, කියා අප සිතන්නට පුළුවනි. 99 දෙනා එකතු වී සිටිනවා කියන එක අපට ආත්මිකව නිවැරදි හා සම්පූර්ණය කියා සිතීමට නොහැක.

''අපට පසුතැවිලි වීමක් අවශ්‍ය නැහැ, මා 99 දෙනාගේ කොටසට අයිතියි" කියා. නමුත් අපට මෙවැනි අවස්ථාවකදී දෙවියන් වහන්සේගේ කරුණාව අධික ලෙස අවශ්‍ය වෙයි. දේව වචනය මෙසේ පවසයි:

***''මක්නිසාද සියල්ලෝම පව් කොට දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති." (රෝම 3:23)***

එනම් 99 දෙනාට අයත් සෑම දෙනාම තම තමාව සෝදිසි කර තමා තුළ තිබෙන දේ හරිගස්සා ගැනීමට අවශ්‍ය වෙයි.

***''එහෙයින් තමා කෙලින් සිටින්නේ යැයි සිතන තැනැත්තේ නොවැටෙන්නට බලාගනීව." (1 කොරින්ති 10:22)***

ප්‍රිය මිත්‍රවරුනි, එඬේරා නැතිවූ බැටළුවන්ව සොයමින් ගිය එක මා ඉතා අගය කරමි. එසේම 99 දෙනා කෙරෙහි එඬේරා තැබූ විශ්වාසය ගැනත් මා සතුටු වෙමි. ඔවුන් සියලු දෙනාම ආරක්ෂා සහිතව සිටියත් යේසුස් වහන්සේ අපට අභියෝගයක් දෙයි. අපට බැටලු රැලේ සිටීමට ලැබීම දෙවියන් වහන්සේගේ දීමනාවකිව. එය අප ආරක්ෂිතයි කියා පුද්ගලික ලෙස පාරටු කිරීමට බැරිය. එසේම අප සියලු දෙනාගේම යටහත්කමත් පසුතැවිලි වීමත් ඉතාම අවශ්‍ය වෙයි. විශ්වාසව සිටින අයට පවා දිගටම තමාගේ මනස අලුත් කර ගැනීමෙන් දෙවියන් වහන්සේගේ කරුණාව ගැන බලා සිටීම අවශ්‍යය වෙයි. 99 දෙනාම නැති වූ බැටළුවා ගැන යාච්ඤා කළ යුතුමයි.

*************

# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 2nd MAY 2025.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**